# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර
## மாவட்ட செயலகம் - அநுராதபுரம
## District Secretariat - Anuradhapura

Fax : 025 - 2222235 E-mail :- dissecanu@sltnet.lk

| | දිස්ත්‍රික් ලේකම් மாவட்ட செயலகர் District Secretary | අතිරේක දිස්ත්‍රික් ලේකම් மேலதிக மாவட்டசெயலாளர் Addi.District Secretary | සහකාර දිස්ත්‍රික් ලේකම් உதவட்ட செயலாளர் Asst.District Secretary | ප්‍රධාන ගණකාධිකාරී பிரதன கணக்காளு Chief Accountant | පරිපාලන නිලධාරී நிர்வாக உத்தியோகத் Admin Officer |
|---|---|---|---|---|---|
| කාර්යාලය அலுவலகம் Office - | 025 - 2235479<br>025 - 2222235 | 025 - 2235048 | 025 - 2222236 | 025 - 2222706 | 025 - 2222237 |
| නිවස/வீடு/Res. - | 025 - 2222205 | 025 - 2223833 | | 53299 | 025 - 2235537 |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය எனது இல My No: | ANU/AGS/18/01/02/ මහවිලච්චිය | ඔබේ අංකය உமது இல Your No: | දිනය திகதி Date : 2020.06.10 |

18 JUN 2020

අධ්‍යක්ෂ ( වාරි කළමණාකරණ )

වාරි කළමණාකරන අංශය,

තැ.පෙ.1702

වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,

බෞද්ධාලෝක මාවත,

කොළඹ 07

<u>මහ වාරිමාර්ග ව්‍යාපාර කන්න රැස්වීම් තීරණ ගැසට් පත්‍රයේ පල කිරීම</u>

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් මහා වාරි ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා පැවැත්වූ වගා කන්න රැස්වීම් තීරණ ඔබ වෙත යොමු කරමි.

02. මෙම තීරණ ගැසට් පත්‍රයේ පළ කිරීමට අවශ්‍ය කටයතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

I. මහ විලච්චිය මහා වාරිමාර්ග ව්‍යාපාරය

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර

ආර්.එම්. වන්නි...

දිසාපති/දිස්ත්‍රික් ...

අනුරාධපුර.

පිටපත්

1. කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ , කළාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර- කා.දැ.පි / අ.ක.ස
2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවිලච්චිය - කා.දැ.පි / අ.ක.ස
3. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, අනුරාධපුර - කා.දැ.පි / අ.ක.ස
4. නේවාසික ව්‍යාපාර කළමණාකරු , මහවිලච්චිය ව්‍යාපාරය - කා.දැ.පි / අ.ක.ස

## ආණ්ඩුවේ නිවේදන

## කන්න රැස්වීම් තීරණ ප්‍රකාශයට පත් කිරීම

මහ විලච්චිය මහා වාරිමාර්ග ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධන ) පනත යටතේ පිහිටුවන ලද මහ විලච්චිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා **"වගා රැස්වීම"** 2020.03.03 දින මහ විලච්චිය නේවාසික ව්‍යාපාර කළමණාකරන රැස්වීම් ශාලවේදී පැවැත්වූ අතර එම කන්න රැස්වීමේදී 2020 යල කන්නයේ වගා කටයුතු සඳහා පහත සහන් වගා කාලසටහන හා යෝජනා සම්මත කරන ලදී.

**2020 යල කන්නයේ වගා කාල සටහන**

| අනු අංකය | කාරණය | දකුණු ඉවුර | වම් ඉවුර |
|---|---|---|---|
| 01 | පහත් ජලයත් සමග වගා කිරීමට යෝජිත මුළු බිම් ප්‍රමාණය ( අක්කර ) | 3100 | |
| 02 | වාරි පහසුකම් සැපයීමට නියමිත ප්‍රමාණය ( අක්කර ) | 2664 | |
| 03 | වගා කිරීමට යෝජිත බෝග වර්ග | වී මාස 3 , 3 ½ , වෙනත් ආහාර බෝග | |
| 04 | ගොවි සංවිධාන සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු දිනය | 2020.03.25 දිනට පෙර | |
| 05 | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරන ඇලවේළි ගොවි සංවිධාන විසින් ශුද්ධ කර අවසන් කළ යුතු දිනය | 2020.03.30 දිනට පෙර | |
| 06 | වගාව ආරම්භය සඳහා සඳහා ජලය නිකුත් කරන දිනය | 2020.04.01 | 2020.04.05 |
| 07 | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2020.04.21 | 2020.04.26 |
| 08 | මූර ජලය ආරම්භ වන දිනය | 2020.04.26 | 2020.05.01 |
| 09 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2020.07.20 | 2020.07.25 |
| 10 | වගාව රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2020.04.21 | 2020.04.26 |
| 11 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2020.08.05 | 2020.08.10 |
| 12 | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | 2020.08.05 | 2020.08.10 |

**සම්මත වූ අනෙකුත් නීති හා රෙගුලාසි**

1. කෙත් ඇලවල් හා බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය. එම මුදල වාරි පද්ධතියේ නඩත්තුවට පමණක් උපයෝගී කර ගත යුතුය.
2. වගා කන්නයකට 3 වතාවක් ඇලවල් ශුද්ධ කල යුතුය.නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම පංගු කොටස සුද්ද පවිත්‍ර නොකරන ගොවීන්ගෙන් කෙත් ඇලක බඹයකට රු.100.00 ක්ද අපවහන ඇල බඹයකට රු.200.00 ක්ද හා බෙදුම් ඇල බඹයකට රු.200.00 ක්ද දඩ මුදලක් අය කිරීම.
3. කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදේශයකින් තොරව කුඹුරුවල පිදුරු පිලිස්සීම වෙනුවෙන් අක්කර 01 ක පිදුරු ගොඩකට රු.1,000.00 ද අක්කරයක අතුරා ඇති විට පිදුරු පිලිස්සීම වෙනුවෙන් රු.2,500.00 ක දඩ මුදලක් අය කිරීම. (ඒ පිළිබඳ අදාල කෘ.ප.නි.ස. නිලධාරීන් පරීක්ෂා කර තීරණ ලබා දිය යුතුය)
4. අයාලේ යන ගවයින්ගෙන් වනහානි සඳහා රු.1,000.00 ක දඩ මුදලක් අය කිරීම හා බෝගයන්ට හෝ වාරිමාර්ග පද්ධතියට / ඇලවේලි හෝ නිර්මිත වලට හානි කල අවස්ථා වලදී අදාල ආයතනයේ ඇස්තමේන්තුගත මුදල දඩයක් ලෙස ගව හිමියාගෙන් අය කිරීම.
5. ගොවි ආරාධනයෙන් ශ්‍රම දායකත්වය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන ඕනෑම අවස්ථාවක සාමාජිකයා ශ්‍රම දායකත්වය ලබා දිය යුතුය .සාමාජිකයා හෝ ඔහුගේ නියෝජිතයෙකු සහභාගී නොවන්නේනම් ප්‍රදේශයේ දැනට පවතින දිනක වැටුප වන රු.1,200.00 ක්ද වරුවකට රු.600.00 ක්ද වශයෙන් ගොවි සංවිධානයට ගෙවිය යුතුය
6. ඇලවේළි / නිර්මිත හෝ වාරි පද්ධතියේ උපාංගවලට හානි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිනවීම වාරිමාර්ග ආඥා පනතේ 23 වෙනි වගන්තිය ප්‍රකාරව ගොවි සංවිධාන වෙත බලය පවරා ඇති අතර එකී පනතේ viii කොටසේ 93 වෙනි වගන්තිය අනුව වැරදිකරුවන් දඩුවමට ලක්වනු ඇත.
7. වාරි ජලයට අපද්‍රව්‍ය / විෂ ද්‍රව්‍ය එක් කරන තැනැත්තන් සම්බන්ධයෙන් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 84 ( 1 ) වගන්තිය ප්‍රකාරව වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට ගොවි සංවිධානයේ නියෝජිතයින් හට බලය පවරා ඇත.
8. මෙම කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ගොවි සංවිධානය වෙත පවරා ඇති අතර ගොවි සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරන ගොවි නියෝජිතයින් හෝ ජල පාලකවරුන් රාජකාරියෙහි නියැලෙන විට බාධා කිරීමක් , ඉඩ නොදීමක් , පරිභව කිරීමක් හෝ හිංසා කිරීමක් සිදු කිරීම , රාජකාරියට බාධා කිරීමේ වරදට වරදකරුවේ. ( ඒ සඳහා වාරිමාර්ග ආඥා පනතේ 95 වැනි වගන්තිය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 72 වගන්තිය ප්‍රකාරව නීතිමය රැකවරණ සළසා ඇත.
9. අනපේක්ෂිත ලෙස අයහපත් කාළගුණික තත්වයක් හෝ කිසියම් පාලනය කරගත නොහැකි බාහිර උපද්‍රවයක් ඇති වූ විට මෙම තීන්දු තීරණ සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ව්‍යාපෘති කළමණාකරන කමිටුව සතුය.
10. මෙම නිවේදනයේ යම් සඳහනක් පිළිබඳව අර්ථ නිරූපන බලය අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් සතුය.

ආර්.එම්.වන්නිනායක,

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්

අනුරාධපුර දිස්ත්‍රික්කය

ආර්.එම්. වන්නිනායක
දිසාපති/දිස්ත්‍රික් ලේකම්
අනුරාධපුර.